සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | | |
|---|---|---|
| නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II | | පැය තුනයි |
| நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II | | மூன்று மணித்தியாலம் |
| Drama and Theatre (Sinhala) I, II | | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

* පහත දැක්වෙන සංවාද, කවි හා සිංදු ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A දේවදූතයා : සව් ශීලාාදී අමිත ගුණ ගණාංගයෙන් උපලක්ෂිත වූ පින්වත් ස්වාමීන් වහන්ස, විචිත්‍ර වර්ණෝපශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.

B රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රවිය මට
ඇදුරු මට දැකා නර බිල්ල ගන්නට
පැදුරු පිට තැබුවා යකුට කන්නට

C ගුරුන්නාන්සේ : එහෙම නෙවේ. එයාට සගිස්කුරුත පුළුවන් ලු. තෙලිඟු පුළුවන් ලු. උඹටත් ඒව පුළුවන් නම් කතා කරපන්.

D උගෙ කාරිය ඌ පැලපොල් වනසන වා
මගේ කාරිය මම පැලපොල් සිටුවන වා
සිතු කාරිය සිතූ දේ සාදා දෙන වා
උඩු වේරිය දෙවි ඌරට හෙණ දෙන වා

E දුල් නිමල් සිසි සෙ දිසි සරදඹරේ සිරි – කල් ලකල් නිතර රැඳි උර මැදුරේ –
තෙද නැබලා – කිත් පතළා – දිසි ලන්දු නයන
නිති ඇන්දු රසාඳුන බන්දු මපිය නරනින්දු සසොබන –

1. උඩරට ශාන්තිකර්මයකට අයත් වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

2. බෞද්ධ පූජා කර්මයකට අයත් වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

3. නාඩගම් සම්ප්‍රදායට අයත් වන්නේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

4. සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

[දෙවැනි පිටුව බලන්න.

5. ආංගික හා සාත්ත්වික අභිනය ප්‍රමුඛ වන ප්‍රාසංගික කලාව කුමක් ද?
(1) සංගීත කලාව (2) දෘශ්‍ය කලාව (3) නර්තන කලාව (4) චිත්‍රපට කලාව

6. වාචික අභිනයෙන් තොරව කතාවක් හෝ අදහසක් නිරූපණය කෙරෙන ප්‍රාසංගික නිර්මාණයක් වන්නේ
(1) ඔපෙරාව ය. (2) මුද්‍රා නාට්‍යය ය.
(3) ගීත නාටකය ය. (4) නෘත්‍ය නාටකය ය.

7. "සැප හා දුක මුසු වූ ලෝකයාගේ ස්වභාවය ආංගිකාදී අභිනය මගින් දැක්වෙන කල එය නාට්‍ය නම් වේ." මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ධනංජය (2) භට්ටලොල්ලට (3) භරතමුනි (4) විශ්වනාථ

8. රූපවාහිනී නාට්‍ය සහ වේදිකා නාට්‍ය යන මාධ්‍ය දෙකට පොදු **නොවන** ලක්ෂණය කුමක් ද?
(1) චරිත නිරූපණය (2) සංගීත භාවිතය
(3) කතා වස්තු විකාශනය (4) ප්‍රදර්ශනය කෙරෙන ස්වරූපය

9. රංගනය පුහුණු වන විට ශරීරය සහ මනස සැහැල්ලු කරගැනීම පිණිස වඩාත් සුදුසු වන්නේ
(1) සංවේදන අභ්‍යාස යි.
(2) පරිකල්පන අභ්‍යාස යි.
(3) ශිථිලකරණ අභ්‍යාස යි.
(4) ශ්වසන අභ්‍යාස යි.

10. ආධුනික රංගන ශිල්පීන්ට ක්ෂණික තීරණ ගැනීමට බොහෝවිට සිදු වන්නේ
(1) රංග ක්‍රීඩාවල යෙදෙන මොහොතේ දී ය. (2) පිටපත හඬ නගා කියවන විට දී ය.
(3) නාට්‍ය පුහුණුවීම්වල යෙදෙන කල්හි ය. (4) භූමිකා නිරූපණය කරන අවස්ථාවල දී ය.

11. පෞද්ගලිකත්වයෙන් මිදී චරිතයට සමාරෝපය වීමට නළු-නිළියන්ට වඩාත් ම උපකාරී වන්නේ
(1) නාට්‍ය උපකරණ ය. (2) වේෂභූෂණ ය.
(3) නාට්‍ය සංගීතය ය. (4) රංගභූමි අලංකරණ ය.

12. ක්ෂණික නිරූපණය යනු
(1) නළු පුහුණුවට යොදා ගන්නා රංග අභ්‍යාසයකි.
(2) නාට්‍ය වැඩමුළුවල දී ඉදිරිපත් කරන රංගනයකි.
(3) පූර්ව සූදානමක් සහිතව රඟ දක්වන නාට්‍යමය අවස්ථාවකි.
(4) පෙර පුහුණුවකින් තොරව ඉදිරිපත් කරන නාට්‍යමය අවස්ථාවකි.

13. "ඒ ඒ දර්ශනවල තමා හැසිරිය යුත්තේ කෙසේ ද? අවස්ථානුකූලව පෙනී සිටින අය අතර වඩා වැදගත් වන්නේ තමා ද නැතහොත් වෙන අයෙක් ද?"
මෙම ප්‍රකාශය අදාළ වන්නේ කා හට ද?
(1) නළු-නිළියන්ට (2) අත්වැල් ගායකයන්ට
(3) නාට්‍ය අධ්‍යක්ෂවරයාට (4) වේදිකා කළමනාකරුට

14. වර්ණ සමග කටයුතු කරන ආනුෂංගික ශිල්පීන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අංග රචනා ශිල්පියා, වාදන ශිල්පියා, පසුතල නිර්මාණ ශිල්පියා
(2) රංගාලෝක ශිල්පියා, පසුතල නිර්මාණ ශිල්පියා, නර්තන ශිල්පියා
(3) වේෂභූෂණ ශිල්පියා, අංග රචනා ශිල්පියා, රංගාලෝක ශිල්පියා
(4) පසුතල නිර්මාණ ශිල්පියා, ගායන ශිල්පියා, අංග රචනා ශිල්පියා

15. වේදිකා පසුතල සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) "සැම විට ම අලංකාර දර්ශනයක් මැවෙන පරිදි නිර්මාණය කළ යුතු ය."
(2) "සවි කිරීම, ගැලවීම හා ප්‍රවාහනයට පහසු වන පරිදි සැදිය යුතු ය."
(3) "විචිත්‍රවත් වූ තරමට නාට්‍යයේ ගුණාත්මක බව වැඩි කළ හැකි ය."
(4) "වේදිකාවේ ඉදිරිපස හා පිටුපස පමණක් ඉදි කළ යුතු ය."

16. චරිතයක් සාර්ථක ලෙස නිරූපණය කිරීමට නම් රූපණ ශිල්පියා
(1) රංග අභ්‍යාස අඛණ්ඩ ව පුහුණු කළ යුතු ය.
(2) රංග විධාන හා සංවාද කෙරෙහි පමණක් අවධානය යොමු කළ යුතු ය.
(3) පිටපත කියවා චරිතයේ භූමිකා මැනවින් හඳුනාගත යුතු ය.
(4) වේදිකා කළමනාකරුගේ උපදෙස් පමණක් පිළිපැදිය යුතු ය.

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තක |
|---|---|---|---|
| **A** | ටෙනසි විලියම්ස් | වෙස් මුහුණු | ධම්ම ජාගොඩ |
| යෙර්මා | ගාර්සියා ලෝර්කා | මූදු පුත්තු | **B** |
| ඩෝල්ස් හවුස් | **C** | බෝනික්කි ගෙදර | සුනිල් විජේසිරිවර්ධන |
| ද බ්‍රූගත් | එව්ගිනි ෂ්වාත්ස් | **D** | ධර්මසිරි බණ්ඩාරනායක |

17. ඉහත වගුවේ **A** කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) ද ෆාදර් (2) අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර්
(3) ද ග්ලාස් මෙනාජරි (4) රන් ෆෝ යුවර් වයිෆ්

18. ඉහත වගුවේ **B** කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) සුනන්ද මහේන්ද්‍ර (2) ගුණසේන ගලප්පත්ති
(3) පියදාස නිශ්ශංක (4) බන්දුල විතානගේ

19. ඉහත වගුවේ **C** කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචකයා ගේ නම කුමක් ද?
(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (2) රේ කුනි
(3) හෙන්රික් ඉබ්සන් (4) බර්නාඩ් ෂෝ

20. ඉහත වගුවේ **D** කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) පැන්ස තුනේ කතාව (2) මරාසාද්
(3) අහස් මාලිගා (4) මකරාක්ෂයා

21. අභිරූපණ රංගනයක් ඉදිරිපත් කිරීමේ දී
(1) ආංගික අභිනය පමණක් යොදාගත යුතු ය.
(2) ඇවිදීම සාමාන්‍ය ආකාරයට සිදු කළ යුතු ය.
(3) මිනිස් සිරුරෙන් මවා පෙන්විය හැකි අවස්ථා තෝරාගත යුතු ය.
(4) චරිතය අතිශයෝක්තියෙන් තොරව නිරූපණය කළ යුතු ය.

22. අංග රචනයේ දී මුහුණේ හැඩතල මතු කිරීමට හා රේඛා ඇඳීමට භාවිත කෙරෙන්නේ
(1) පැන් කේක් ය. (2) රූජ් ය.
(3) නෝස් පොටි ය. (4) මේක් අප් පෙන්සිල්ස් ය.

23. නළුවරණයේ දී සිදු කෙරෙන්නේ
(1) ඒ ඒ චරිතයට ගැළපෙන නළු නිළියන් තෝරා ගැනීම යි.
(2) නළු-නිළියන්ට පිටපතේ ඇති එක් එක් චරිත හඳුන්වාදීම යි.
(3) නළු-නිළියන්ට නාට්‍ය පුහුණුව සඳහා දින ලබාදීම යි.
(4) නළු-නිළියන්ට ඔවුන් කැමති චරිත බෙදාදීම යි.

24. ප්‍රසිද්ධ කතාන්දරයක් ඇසුරෙන් නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී
(1) කථකයා ප්‍රධාන චරිතය බවට පත් කළ යුතු ය.
(2) නාට්‍යයට උචිත අවස්ථා හා චරිත පමණක් තෝරාගත යුතු ය.
(3) කතාවේ එන සියලු ම චරිත හා සිද්ධි ඇතුළත් කළ යුතු ය.
(4) අලුත් චරිත හා සිදුවීම් ඇතුළත් නො කළ යුතු ය.


25. රංග භූමියක අවශ්‍යයෙන් ම තිබිය යුතු මූලික පහසුකමක් වන්නේ
(1) රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම යි.
(2) ප්‍රධාන තිරය සහ පැති තිර සවිකර තිබීම යි.
(3) විදුලි පහන් සවිකර තිබීම යි.
(4) ප්‍රේක්ෂකයන් සඳහා ආසන පනවා තිබීම යි.

• පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **26** සිට **29** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A

B

C

D

E

26. තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ මුල්ම නිෂ්පාදනය සමග සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

27. ඉංග්‍රීසි මෙන්ම සිංහල නාට්‍ය නිර්මාණවලට රංගනයෙන් දායක වූයේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

28. වීදි නාට්‍යවල රඟපෑමට ප්‍රසිද්ධියක් උසුලන්නේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

29. මිපුර වැසියෝ නාට්‍ය නිර්මාණයට රංගනයෙන් සම්බන්ධ වූයේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

30. සූනියම් යක්ෂණිය වෙශ තුනකින් පැමිණෙන්නේ
(1) රිද්දි යාගයේ දී ය.
(2) සන්නි යකුමේ ය.
(3) සූනියම් යාගයේ දී ය.
(4) මහසොහොන් සමයමේ ය.

31. සොකරි සෙසු ගැමි නාට්‍ය සම්ප්‍රදායන්ගෙන් වෙනස් වන්නේ
(1) ස්ත්‍රී චරිත පිරිමින් විසින් රඟ දක්වනු ලබන නිසා ය.
(2) නාට්‍යධර්මී ශෛලියට අනුගත වන බැවින් ය.
(3) රාත්‍රිය මුළුල්ලේ රඟ දක්වන හෙයිනි.
(4) එකම කතා පුවතක් පදනම් කරගන්නා බැවින් ය.

32. රාජකාරි කරන පුද්ගලයන් හාස්‍යයට හා උපහාසයට ලක් කරන සිංහල ගැමි නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
(1) සොකරි (2) කෝලම්
(3) නාඩගම් (4) කවිනළුව

33. චාර්ලිස් ද ආබ්‍රෙව් විසින් රචනා කරන ලද නාඩගම කුමක් ද?
(1) ඉපුජින් (2) ස්ථාක්කි
(3) බුම්පෝඩි (4) සෙලෙස්තිනා

34. නාට්‍ය ගීත ගායනයේ දී රංගන ශිල්පීන් වඩාත් සැලකිලිමත් විය යුත්තේ කුමන කාරණය කෙරෙහි ද?
(1) රිද්මයානුකූල අංග චලන භාවිත කිරීම
(2) තාලාන්විත චලන රටා අනුගමනය කිරීම
(3) ප්‍රේක්ෂක සහ සෙසු ශිල්පීන්ගේ ප්‍රතිචාර
(4) භාවාත්මකව රංග කාර්යය උද්දීපනය කිරීම

/පස්වැනි පිටුව බලන්න.

**35.** නාඩගම් සම්ප්‍රදායේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ

(1) තාල වාදනය සඳහා මද්දල භාවිත කිරීම ය.

(2) පාත්‍ර වර්ගයා වෙස් මුහුණු පැළඳ නැටීම ය.

(3) පහතරට ශාන්තිකර්මවල ආභාසය දක්නට ලැබීම ය.

(4) සබේ විදානේ සහ ගායක කණ්ඩායම විසින් කතාව ඉදිරිපත් කිරීම ය.

**36.** රංග වින්‍යාසය යනු

(1) නළු ප්‍රවේශයට හා නිෂ්ක්‍රමණයට ගමන් තාල යොදා ගැනීම යි.

(2) වේදිකාව සමබර කිරීමට රංගන ශිල්පීන් ස්ථානගත කිරීම යි.

(3) වේදිකා අවකාශය තුළ නළු-නිළියන් අර්ථවත් ලෙස චලනය කරවීම යි.

(4) ගීතවල රිද්මයට පමණක් පාත්‍ර වර්ගයා චලනය කරවීම යි.

**37.** මෙම ශිල්පීන් අතරින් කෝලම් නාටක සඳහා ප්‍රවීණයකු වන්නේ

(1) ජුවානිස් පෙරේරා ය.

(2) ස්ටීවන් සිල්වා ය.

(3) ගුණදාස ගුරුන්නාන්සේ ය.

(4) පී. පීරිස් ය.

**38.** දික්තල හා කාලගෝල, කැලණි පාලම වැනි නාට්‍යවල රඟපා ජනාදරයට පත් වූ රංගන ශිල්පිනිය කවුරුන් ද?

(1) රම්‍යා වනිගසේකර

(2) මැණිකේ අත්තනායක

(3) රත්නා ලාලනි ජයකොඩි

(4) චාන්දනී සෙනෙවිරත්න

**39.** ආදි විශ්වවිද්‍යාලයීය සිංහල සමිතිය විසින් විදේශීය කෘති ඇසුරෙන් වේදිකාගත කළ නාට්‍ය පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ඉබේ වෙදා, මුදලාලිගේ පෙරළිය, කපුවා කපෝති

(2) හැංගි හොරා, කපුවා කපෝති, හුණුවටයේ කතාව

(3) මුදලාලිගේ පෙරළිය, වෙද හටන, බෙරහඬ

(4) රහස් කොමසාරිස්, හරිම බඩු හයක්, වෙද හටන

**40.** ළමා නාට්‍ය සඳහා වඩාත් ම යෝග්‍ය වන්නේ

(1) සත්ත්ව ලෝකයේ සිදුවීම් නිරූපණය කෙරෙන කතා පුවත් ය.

(2) සුරංගනාවියන් හා මායාකාරයන් ඇතුළත් අද්භූතජනක කතාන්දර ය.

(3) ළමුන් සැබෑ ලෝකයේ මුහුණදෙන කටුක ජීවන අත්දැකීම් සහිත කතා පුවත් ය.

(4) ළමා සිතුම් පැතුම් සහිත යහපත් ආකල්ප වර්ධනය කරන කතා පුවත් ය.

* *

/හයවැනි පිටුව බලන්න

**50 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

## නාට්‍ය හා රංග කලාව (සිංහල) II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   - (i) විකෘති නාට්‍යය රචනා කළ නාට්‍යවේදිනිය කවුරුන් ද? (ලකුණු 02 යි)
   - (ii) ඇයට එම නාට්‍යය නිර්මාණය කිරීම සඳහා බලපානු ලැබුයේ කුමන වෘත්තියක අත්දැකීම් ද? (ලකුණු 02 යි)
   - (iii) සංවාදවලින් කියැවෙන පරිදි, ප්‍රියංගනීගේ චරිත ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   - (iv) මෙම නාට්‍යයේ උග්‍ර ගැටුමක් ඇති වන්නේ කවුරුන් අතර ද? (ලකුණු 02 යි)
   - (v) උපහාසාත්මක සමාජ විවේචනයක් අඩංගු අවස්ථා **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)
   - (vi) 8 වන දර්ශනයේ ඔබ දකින විශේෂ ලක්ෂණය කුමක් ද? (ලකුණු 02 යි)

2. (i) පත්තිනි දේවතාවිය උදෙසා පැවැත්වෙන ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   - (ii) ඉහත (i) හි ඔබ නම් කළ **එක්** ශාන්තිකර්මයක අන්තර්ගත නාට්‍යමය පෙළපාළි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   - (iii) ඉහත (ii) හි සඳහන් කළ **එක්** අංගයක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

3. (i) නාට්‍ය සංවාද රචනා කෙරෙන ශෛලීන් **දෙකක්** හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි)
   - (ii) රූපණ ශිල්පියකු විසින් සංවාද උච්චාරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   - (iii) නාට්‍ය සංවාද මගින් ඉටු කෙරෙන කාර්යයන් **තුනක්** ඔබ ඉගෙන ගත් නාට්‍ය කෘතිවලින් උදාහරණ දෙමින් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

4. (i) අතීතයේ දී ශාන්තිකර්ම හා ගැමි නාට්‍ය සඳහා ආලෝකය සපයාගත් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   - (ii) වර්තමාන නාට්‍ය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග **දෙකක්** සහ දෘශ්‍ය ප්‍රයෝග උපකරණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   - (iii) වේදිකා නාට්‍ය රඟ දැක්වීමේ දී රංගාලෝකය මගින් ඉටු කරගත හැකි කාර්යයන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

5. (i) ප්‍රකට නූර්ති රචකයන් **දෙදෙනකු** හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි)
   - (ii) නූර්ති සංක්‍රමණික නාට්‍ය කලාවක් ලෙස හඳුන්වනු ලබන්නේ කුමක් නිසා දැයි පහදන්න. (ලකුණු 04 යි)
   - (iii) පැරණි ගැමි නාට්‍යවල නොතිබුණු, එහෙත් නූර්තිවල දක්නට ලැබෙන නවීන ලක්ෂණ මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

6. (i) 1950 සිට 1970 දක්වා දශකවල ස්වතන්ත්‍ර නාට්‍ය රචනා කළ **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) 'ස්වතන්ත්‍ර' නාට්‍ය යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iii) ඉහත (i) හි නම් කළ ස්වතන්ත්‍ර නාට්‍ය රචකයකුගෙන් සිංහල නාට්‍ය කලාවට සිදු වූ සේවය අගය කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. කෙටි කාලයක් තුළ විකාශනය වන අවස්ථාවක් එක ස්ථානයක සිදුවන අයුරින් නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

පංතියට ඇතුළු වන ගුරුතුමා, පාසලේ වාර්ෂික ප්‍රසංගයට නාට්‍යයක් කළ යුතු බව සිසුන්ට දන්වයි. නාට්‍යයට සුදුසු තේමාවක් පිළිබඳව ගුරුතුමා සිසුන්ගේ අදහස් විමසයි. සුරංගනා කතාවක් අනුව ළමා නාට්‍යයක් කරමු යැයි කමනි යෝජනා කරයි. ජාතක කතාවක් ඇසුරෙන් ලියූ ආදර්ශමත් පිටපතක් තමා ළඟ ඇති බව කසුන් කියයි. ඊට විරුද්ධ වන විමල්, පාසල් සිද්ධි අලළා කොමඩි නාට්‍යයක් කරමු යැයි පවසයි. විමල් කියූ දේ පංතිය අසල සිටි විදුහල්පතිතුමාට ඇසෙයි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

❊ ❊ ❊

**Disclaimer:**

Please note that some O/L past papers include answers marked by students. These are **not confirmed or official answers**. They are not official.

